# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 10 දරන දෛනික වැටුප් ලබන ලංකා දුම්රිය කම්කරු යහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 5 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1975 මාර්තු මස 24 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

# ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 10 දරන දෛනික වැටුප් ලබන ලංකා දුම්රිය කම්කරු යහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1975 මාර්තු මස 5 වන දින]

ඇල්.ඩී.—ඕ. 02/74.

**1965 අංක 3 දරන දෛනික වැටුප් ලබන ලංකා දුම්රිය කම්කරු යහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 10 දරන දෛනික වැටුප් ලබන ලංකා දුම්රිය කම්කරු යහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1965 අංක 3 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1965 අංක 3 දරන දෛනික වැටුප් ලබන ලංකා දුම්රිය කම්කරු යහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනතෙහි 9 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> "(2) කමිටුවේ විශේෂ රැස්වීමක් කැඳවීම යෝග්‍ය යයි සභාපතිවරයා හෝ දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා සලකන කවර විටක වුව ද අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයා විසින් නැතහොත් සාමාන්‍යාධිකාරීවරයා විසින් එහි විශේෂ රැස්වීමක් කැඳවීම නීත්‍යනුකූල වන්නේ ය. සාමාන්‍යාධිකාරීවරයා විසින් රැස්වීමක් කැඳවනු ලබන අවස්ථාවක, ඔහුට හෝ ඔහුගේ නියෝජිතයාට එම රැස්වීමට පැමිණ සිටීමේ සහ එහි පැමිණ සිටින සාමාජිකයන් ඇමතීමේ අයිතිය ඇති නමුත් ඡන්දය දීමේ අයිතිය නොමැත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

> 'ගණන් පොත්.
>
> 10. සංස්ථාවේ සාමාජිකයන් විසින් ද රජයේ දුම්රිය සේවය පිළිබඳ විෂය භාර (මෙහි මින් මතු "අමාත්‍යාංශයේ ලේකම්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් හෝ එම පොත් පරීක්ෂා කිරීමට යම් අවස්ථාවක පත් කළ හැකි යම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ද සියලු යුක්ති සහගත වේලාවන්හි දී පරීක්ෂා කරනු ලැබීම සඳහා විවෘතව තිබිය යුතු සුදුසු ගණන් පොත් තබනු ලැබීමට කමිටුව විසින් සැලැස්විය යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ශ 09881—8791 (74/10)

" (5) අමාත්‍යාංශයේ ලේකම් විසින් ස්ථිර කරනු ලැබී නම් මිස කිසිම රීතියක් හෝ යම් රීතියකට කෙරෙන කිසිම සංශෝධනයක් හෝ යම් රීතියක් පරිච්ඡින්න කිරීමක් හෝ බල සහිත නොවන්නේය. ඒ ස්ථිර කිරීම පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එවිට එය මෙහිලා පනවන ලද්දක් මෙන් වලංගුව බලපවත්වන්නේ ය.".

18අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 18අ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය:—

" සංස්ථාවේ රීති සෑදීමට, සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා සතු බලය.

18අ. (1) 18 වන වගන්තියෙහි විධිවිධාන කුමක් වුවද දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් සංස්ථාවෙහි යම් රීතියක් සෑදීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) එවැනි රීතියක්, සංශෝධනයක් හෝ පරිච්ඡින්න කිරීමක් එය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නම් මිස, බල සහිත නොවන්නේ ය.

(3) සාමාන්‍යාධිකාරීවරයා විසින් සාදන ලද යම් රීතියක් හා සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් හා අතර යම් ගැටීමක් හෝ නොගැළපීමක් ඇති අවස්ථාවක සාමාන්‍යාධිකාරීවරයා විසින් සාදන ලද රීතියෙහි විධිවිධාන බලපවත්වන්නේ ය.".

19අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය:—

" සංස්ථාවේ මහා සභා රැස්වීම් කැඳවීමට දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා සතු බලය.

19අ. (1) 19 වන වගන්තියේ විධිවිධාන කුමක් වුවද සංස්ථාවේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් කැඳවීම යෝග්‍ය යයි දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා සලකන කවර විටක වුව ද යටත් පිරිසෙයින් දින හතක දැන්වීමක් කර ඔහු විසින් එවැනි මහා සභා රැස්වීමක් කැඳවීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සාමාන්‍යාධිකාරීවරයාට හෝ ඔහුගේ නියෝජිතයාට එම රැස්වීමට පැමිණ සිටීමේ සහ එහි පැමිණ සිටින සාමාජිකයන් ඇමතීමේ අයිතිය ඇති නමුත් ඡන්දය දීමේ අයිතිය නොමැත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ ;—

" (8) ඉහත කී පරිදි විගණකවරයකු තෝරා පත් කිරීමක් නොකරන ලද නම්, සංස්ථාවේ යම් සාමාජිකයකුගේ ඉල්ලීමක් පිට හෝ නොඑසේව, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, එවැනි යම් ශේෂ පත්‍රයක් සහ ගිණුම් ප්‍රකාශයක් පරීක්‍ෂා කිරීමේ හා විගණනය කිරීමේ කාර්යය සඳහා විගණකවරයකු හෝ විගණකවරයන් පත් කිරීම ද ඔහුට හෝ ඔවුන්ට සංස්ථාව විසින් ගෙවිය යුතු පාරිශ්‍රමිකය නියම කිරීම ද කළ හැකි ය. ඒ අනුව එම පාරිශ්‍රමිකය ගෙවනු ලැබිය යුතු ය. එසේ පත් කරනු ලැබූ යම් විගණකවරයකු හෝ විගණකවරයන් (3) වන උප වගන්තිය යටතේ විධිමත් පරිදි තෝරා පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) අමාත්‍යාංශයේ ලේකම් විසින් ඕනෑම අවස්ථාවක තමාගේම ඕනෑකම පිට හෝ තමා වෙත ඉදිරිපත් කරන ලද කරුණු අනුව, සංස්ථාවේ කටයුතු පිළිබඳ පරිපාලනය සහ සංස්ථාවේ මුදල් පිළිබඳව විමර්ශනය කොට වාර්තා කිරීම පිණිස ද සංස්ථාවේ කටයුතු පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ කිරීම පිණිස ද පරීක්ෂණ මණ්ඩලයක් වශයෙන් එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් ගණනක් පත් කරනු ලැබිය හැකි ය.";

(2) එහි (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (3) විමර්ශනයෙන් පසු හැකි තාක් ඉක්මණින් ඒ සෑම මණ්ඩලයක් විසින් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර එම වාර්තාවේ පිටපත් සංස්ථාවේ නිල දරන සෑම තැනැත්තකුටම සහ සෑම සාමාජිකයකුටම යවනු ලැබීමට ලේකම්වරයා විසින් සැලැස්විය යුතු ය.";

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (4) මේ වගන්තිය යටතේ යම් පරීක්ෂණයක් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හා මණ්ඩලය විසින් කරනු ලබන සියලු වියදම් සංස්ථාවේ මුදල් කෙරෙහි වැයබරක් වන්නේ ය."; සහ

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "ස්ථිර ලේකම්" යන යෙදුම වෙනුවට "අමාත්‍යාංශයේ ලේකම්" යන යෙදුම ආදේශ කිරීමෙනි.

30අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 30අ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය :—

" කමිටුව මගින් අයථා පාලනයක් කරගෙන යනු ලැබුවහොත් විශේෂ පරිපාලක කමිටුවක් පත් කිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් විධාන කළ යුතු බව.

30අ. (1) 30 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාවකින්—

(අ) සංස්ථාවේ කටයුතු පරිපාලනයෙහි ලා මූ බලවත් අක්‍රමිකතාවන් ; හෝ

(ආ) සංස්ථාවේ මුදල් පිළිබඳ බරපතල අයථා පාලනයක්

එළිදරව් වන අවස්ථාවක, 6 වන වගන්තිය යටතේ තෝරා පත් කර ගන්නා ලද කමිටුව විසුරුවා හැර, (5) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව නව නිලධාරීන් සහ නව කමිටුවක් තෝරා පත් කර ගන්නා තුරු සංස්ථාවේ කටයුතු පිළිබඳ පරිපාලනය ගෙන යෑමට තැනැත්තන් තුන් දෙනකුගෙන් සමන්විත විශේෂ පරිපාලක කමිටුවක් පත් කරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් විසින් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයාට විධාන කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විධානයක් කරනු ලැබූ අවස්ථාවක, සාමාන්‍යාධිකාරීවරයා විසින්—

(අ) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් කමිටුව විසුරුවා හැරිය යුතු ය ; තව ද

(ආ) විශේෂ පරිපාලක කමිටුවක් පත් කළ යුතු ය.

(3) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ නියමයක් මගින් සාමාන්‍යාධිකාරීවරයා විසින් කමිටුවක් විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක, එම නියමය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිට එම කමිටුව විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) නව නිලධාරීන් සහ නව කමිටුවක් තෝරා පත් කර ගන්නා තුරු, තෝරා පත් කර ගනු ලැබූ කමිටුවක් විසින් සාමාන්‍යයෙන් කර ගෙන යනු ලබන කටයුතු කරගෙන යාමේ සහ ක්‍රියාවෙහි යොදනු ලබන බලතල ක්‍රියාවෙහි යෙදවීමේ

සම්පූර්ණ බලය සහ අධිකාරය සාමාන්‍යාධිකාරීවරයා විසින් (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ විශේෂ පරිපාලක කමිටුවකට ඇත්තේ ය.

(5) තෝරා පත් කර ගන්නා ලද කමිටුව විසුරුවා හරින ලද දිනයේ සිට හය මාසයකට වඩා පසු නොවී, සාමාන්‍යාධිකාරීවරයා විසින්, නව නිලධාරීන් සහ නව කමිටුවක් තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා සංස්ථාවේ සාමාජිකයන්ගේ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතු ය.”.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (2) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උප වගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

“ (2) සංස්ථාවේ ගණන් බේරා එය වසා දැමීමේ යෝජනාව අවශ්‍ය වැඩි සංඛ්‍යාවෙන් සම්මත කරනු ලැබූ අවස්ථාවක, ණය දීම වහාම නැවැත්විය යුතු අතර, සංස්ථාවේ කටයුතු නතර කොට එහි වත්කම් බෙදා හැරීමේ කාර්යය සඳහා අමාත්‍යාංශයේ ලේකම් විසින් ඇවරකරුවකු පත් කළ යුතු ය. සංස්ථාවේ ණයතුරුස් ලියවීමෙන් පසු වත්කම් කිසිවක් ඇත් නම් එය සංස්ථාවේ එක් එක් සාමාජිකයාගේ බැරට ඇති දායක මුදල්වලට හා පරිත්‍යාගවලට අනුකූලව සංස්ථාවේ සාමාජිකයන් අතර ප්‍රමාණානුකූලව බෙදා හැරිය යුතු ය.”.

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණ දායක මුදල් භාරගනු ලැබේ.